සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் /

Department of Examinations, Sri Lanka

| කොටස | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| I | 1 | |
| | 2 | |
| | 3 | |
| II | 4 (i) | |
| | 4 (ii) | |
| | 4 (iii) | |
| එකතුව | | |
| උත්තර පත්‍ර පරීක්ෂක | | |
| ලකුණු පරීක්ෂා කළේ | | |

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015 (2016)

**(02) අවබෝධය හා සිද්ධි අධ්‍යයනය**

පැ දෙකයි

● ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

විභාග අංකය : ........................

## I කොටස - අවබෝධය

**1.** පහත දැක්වෙන මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන **300** ක් පමණ වන සේ විශ්ලේෂණාත්මක රචනයක් ලියන්න.

(i) දැනුමෙන් සහ විනය ගරුකත්වයෙන් පිරිපුන් සිසු පරපුරක් තැනීම උදෙසා පාසල් ගුරුවරයාගෙන් ඉටු විය යුතු කාර්යභාරය

(ii) ත්‍රිභාෂා සංකල්පය පාදකකොට ගෙන ශ්‍රී ලාංකේය අධ්‍යාපනය හැඩගැස්වීමේ යෝග්‍යතාව

(iii) පාසල් අධ්‍යාපනය සඳහා හඳුන්වා දෙනු ලැබූ නව තාක්ෂණික මෙවලම් මගින් සිසුන්ට ලැබෙන ප්‍රතිලාභ

(iv) මනුෂ්‍ය චරිත සංවර්ධනයෙහි ලා සාහිත්‍ය - සංගීත කලා මාධ්‍ය මගින් ලැබෙන දායකත්වය

(v) මනුෂ්‍ය ප්‍රජාවට තර්ජනයක් වූ මත්ද්‍රව්‍ය භාවිතය ලෝකයෙන් තුරන්කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

Department of Examinations, Sri Lanka

Department of Examinations, Sri Lanka

[ 3 වැනි පිටුව බලන්න.

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

(ලකුණු 30 යි)

2. පහත දැක්වෙන පාඨවල අදහස තනි වාක්‍යයකින් ලියා තද කළු අකුරින් මුද්‍රිත පදවලට විවරණ සපයන්න.

(i) අවිආයුධ ව්‍යාප්තිය නතර කිරීම, සියලු සමූහ ඝාතන අවි අඩුකිරීම සහ කල්යාමේ දී තුරන් කිරීම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අභිමතාර්ථ වේ. නිරායුධකරණය අරභයා කතිකා කිරීම, නිර්දේශ කිරීම සහ අධ්‍යයන ඇරඹීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය අඛණ්ඩ සංසදයක් වී තිබේ. නිරායුධකරණය පිළිබඳ සම්මන්ත්‍රණයේ දී සහ වෙනත් ජාත්‍යන්තර පුද්ගල මණ්ඩලවල දී බහුපාර්ශ්වීය සාකච්ඡා සඳහා එම සංවිධානය සහයෝගය දෙයි. න්‍යෂ්ටික ප්‍රගුණනය වැළැක්වීමේ සම්මුතිය, න්‍යෂ්ටික පර්යේෂණ තහනම් කිරීමේ අවබෝධාත්මක සම්මුතිය සහ න්‍යෂ්ටික ක්‍රියා මුක්ත ප්‍රදේශ පිහිටුවීමේ සම්මුතිවලට මෙම කතිකාවල ප්‍රතිඵලයක් වශයෙන් එළැඹීමට හැකි වී තිබේ.

(ii) නිදන්ගත වකුගඩු රෝගය නිසා ආදායම අහිමි වී යෑම හේතුවෙන් මුළු පවුලේම සමාජ ආර්ථික තත්ත්වයට අහිතකර ලෙස බලපෑම් ඇති වේ. ශ්‍රී ලංකාව තුළ පුළුල් විධිමත් සමාජ සත්කාරක පද්ධතියක් නොමැති අතර වකුගඩු රෝගය ඇති වූ දා පටන් ඵලදායිතාව අහිමි වීම සහ වෛද්‍ය උපදෙස්, ඖෂධ, රුධිර කාන්දුකරණය සහ බද්ධකිරීම් සඳහා වියදම් දැරීමට සිදු වේ. මේ හේතුවෙන් ප්‍රජාව සහ පවුල්, ආර්ථික වශයෙන් අස්ථාවර තත්ත්වයන්ට පත් වේ.

[ 4 වැනි පිටුව බලන්න.

393
Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

(iii) දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් අවම කිරීම අරමුණු කරගෙන වනහරණය සහ වනහායනය මගින් සිදුවන කාබන් විමෝචනය අඩු කළ යුතු ය. මේ සඳහා වන එක්සත් ජාතීන්ගේ වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ වනහරණය සහ වනහායනය සඳහා වන ප්‍රධාන සාධක හඳුනා ගැනීම අවශ්‍ය වේ. මේ සඳහා මූලික වැඩකටයුතු සහ පර්යේෂණ කටයුතු සිදු කරන ලදී.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

(iv) වෘත්තීය හා කාර්මික ක්ෂේත්‍රය තුළ ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු රාජ්‍ය නොවන අංශයේ අධ්‍යාපන ආයතන ස්ථාපිත කිරීම වැදගත් වේ. වෘත්තීය අධ්‍යාපනය මගින් සත්කාරක සේවය, හෙද සේවය, යාන්ත්‍රික, ජලනළ කාර්මික ශිල්පය, වඩු කර්මාන්තය, ඖෂධවේදය හා ප්‍රමාණාත්මක සමීක්ෂණය වැනි වෘත්තීය ක්ෂේත්‍රවල සේවය කිරීම සඳහා සිසුහු සූදානම් කරනු ලැබෙති. එබැවින් දේශීය හා විදේශීය වශයෙන් වර්ධනය වන වෙළෙඳපොළ හා කාර්මික අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසුකම් ලත් දක්ෂ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමට මෙම ආයතනවලට හැකියාව පවතී.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

*(ලකුණු 05 × 4 = 20 යි)*

**3.** පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාවෙන් තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. සාරාංශය අවසානයේ ඔබ ලියූ වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

සුදුසු දැනුම සහ නිපුණතා සහිත ඵලදායී ශ්‍රම බලකායක් ගොඩනැංවීමෙහි ලා අධ්‍යාපන අංශය වැදගත් භූමිකාවක් නිරූපණය කරයි. ශ්‍රම වෙළෙඳපොළේ වෙනස් වන අවශ්‍යතාවන්ට ගැළපෙන ගතික අධ්‍යාපන අංශයක් ඇති කිරීම සඳහා රජය විවිධ වෙනස්කම් රාශියක් ක්‍රියාවට නැංවීම ආරම්භ කොට ඇත. එසේ කිරීමේ දී අධ්‍යාපන අංශයේ ධාරිතාව ශක්තිමත් කිරීම, ප්‍රාථමික, ද්විතීයික හා උසස් අධ්‍යාපන අංශවල ගුණාත්මකභාවය සහ අදාළ බව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. ඒ සමගම තාක්ෂණික සහ වෘත්තීය පුහුණුව ලබා දීමෙන් දැනට දැනුම පිළිබඳව පවතින අඩුපාඩු මගහරවා ගැනීමට අවධානය යොමු වී ඇත. අධ්‍යාපන අංශය නැවත සැලසුම් කිරීමේ දී අධ්‍යාපන ප්‍රතිපත්තිය ශ්‍රම ඉල්ලුම සහ රටේ ආර්ථික ප්‍රතිපත්තිය සමග සෘජුව සම්බන්ධ කළ යුතු බව අවබෝධ කරගැනීම වැදගත් වේ.



Department of Examinations, Sri Lanka

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

ශ්‍රී ලංකාව දැනුම් කේන්ද්‍රයක් ලෙස නැගී සිටීම සඳහා අවශ්‍ය මානව ප්‍රාග්ධනයේ අඩිතාලම දැමීමට සාමාන්‍ය අධ්‍යාපනයේ සැලකිය යුතු නවීකරණයක් විය යුතු බව හඳුනාගෙන තිබේ. අධ්‍යාපන ප්‍රතිපත්තිය යළි සකස් කිරීම සඳහා නව අධ්‍යාපන පනතක් කෙටුම්පත් කිරීමේ කාර්යය ආරම්භ කර ඇත. මෙම නව පනත මගින් අධ්‍යාපනයේ කඩිනම් සහ ප්‍රශස්ත මට්ටමේ ගුණාත්මක වර්ධනයක් සිදුවනු ඇතැයි බලාපොරොත්තු වේ. මේ අතරම විභාග අරමුණු කොටගත් විෂය මත පදනම් වූ අධ්‍යයන පටිපාටිය වෙනුවට නිපුණතා පදනම් කරගත් අධ්‍යයන පටිපාටියක් වෙත යොමු වීම, ඉංග්‍රීසි විෂයය හා තොරතුරු තාක්ෂණය දියුණු කිරීම සහ ජීවන කුසලතා අත්කර ගැනීම සඳහා අවස්ථා ලබාදීම වැනි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා ද පියවර ගෙන ඇත.

ඉහළ ආර්ථික වර්ධනයක් සමගින් ශ්‍රී ලංකාව මැදි ආදායම් ලබන රටක් බවට පත්වීමට ඉලක්ක කර සිටින හෙයින්, ශ්‍රී ලංකාවට දැනුම පදනම් කරගත් ආර්ථිකයක් ඉලක්ක කරගත් ශක්තිමත් ක්‍රමෝපායන් සකස් කිරීම අවශ්‍ය වන අතර, ඒ සඳහා අදාළ අංශ ජාතික මට්ටමෙන් ප්‍රතිසංස්කරණය කළ යුතුව ඇත. මේ සම්බන්ධයෙන් මේ වන තෙක් ලබා ඇති ප්‍රගතිය සීමාසහිත වන හෙයින්, ශ්‍රී ලංකාව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, නව සොයාගැනීම්, ආර්ථික දිරිගැන්වීම් යන අංශ සම්බන්ධයෙන් ලබා ඇති ශ්‍රේණිය වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කළ යුතුව ඇත.

(ලකුණු 20 යි)



Department of Examinations, Sri Lanka

## II කොටස - සිද්ධි අධ්‍යයනය

**4.** පහත සඳහන් සිද්ධිය/අවස්ථාව කියවා, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රාජපුර ජාතික ගුරු අධ්‍යාපන විද්‍යා පීඨය දැනට අවුරුදු 10 කට පෙර ගුරු විද්‍යාල භූමියක ස්ථාපනය කරන ලද විද්‍යා පීඨයකි. ගුරු විද්‍යාලයේ පිහිටි ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර විද්‍යා පීඨය ආරම්භ කරන ලද අතර ගුරු විද්‍යාලය සතුව පැවති ලීබඩු හා උපකරණවලට අමතරව පරිගණක 10 ක් හා ඊට අවශ්‍ය උපාංග ද එම අවස්ථාවේ දී විද්‍යා පීඨයට ලබාදෙන ලදී. ඉන් අනතුරුව පසුගිය වසර 10 ඇතුළත ප්‍රාග්ධන භාණ්ඩ කිසිවක් විද්‍යා පීඨය සඳහා නොසැපයුණු අතර සුළු අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් වාර්ෂිකව ලබාදෙන මුදල හැරුණු විට ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු සඳහා වෙනත් කිසිදු මූල්‍යමය ප්‍රතිපාදනයක් ලැබුණේ නැත.

දැනට මෙම විද්‍යා පීඨයට ප්‍රාථමික අධ්‍යාපනය, භාෂා ශාස්ත්‍ර හා සමාජ අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍රයන්හි පාඨමාලා සඳහා වසරකට නවක සිසුහු 150 ක් පමණ බඳවා ගැනෙති. මේ වන විට පීඨාධිපතිවරයා පැරණි ගුරු විද්‍යාලයේ විදුහල්පති පදිංචිව සිටි ගුරු නිවාසයේ පදිංචිව සිටින අතර ශිෂ්‍ය නේවාසිකාගාරවල ඇති කාමර කිහිපයක කථිකාචාර්යවරු කිහිපදෙනෙක් තනිකඩයින් වශයෙන් නැවතී සිටිති. අනෙකුත් කථිකාචාර්යවරුන්ට මෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ද අවට ගමේ නිවාසවල කුලියට සිටීමට හෝ තම නිවෙස්වල සිට පොදු ප්‍රවාහන සේවාවලින් පැමිණීමට හෝ සිදුව ඇත. මේ නිසා මොවුහු බොහෝ දෙනෙක් පුරුද්දක් වශයෙන් ප්‍රමාද වී රාජකාරියට පැමිණෙන අතර ඉක්මනින් ආපසු යාමට ද උත්සාහ ගනිති. මේ හේතුවෙන් විද්‍යා පීඨයේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පෙර හා ඉන් පසුව ශිෂ්‍යයින්ගේ විෂය සමගාමී කටයුතු අධීක්ෂණය සහ පැනනගින විනය ගැටලු නිරාකරණය කිරීමේ වගකීම පීඨාධිපතිවරයා හා නේවාසිකාගාරවල නැවතී සිටින කථිකාචාර්යවරුන් කිහිපදෙනා මත පැවරී ඇත. ඔවුන් ද එම කටයුතුවලට සහභාගි වන්නේ මන්දෝත්සාහී ස්වභාවයකිනි.

නේවාසිකාගාරවල පවතින අධික තදබදය හේතුකොට ගෙන දේශන පැවැත්වෙන කාල සීමාවෙන් පසුව ද ශිෂ්‍යයෝ තම අධ්‍යයන කටයුතු කරගැනීම සඳහා දේශනශාලා භාවිත කරති. එහෙත් නිතර නිතර සිදුවන විදුලි විසන්ධිවීම් ඔවුන්ට බාධා ඇති කරයි. සියලුම ශිෂ්‍යයින්ට රැස්විය හැකි සම්මන්ත්‍රණ ශාලාවක් ද විද්‍යා පීඨය තුළ නොමැත. ජලසම්පාදන මණ්ඩලයේ ජලනළ මගින් නේවාසිකාගාරවලට ජල සැපයුමක් තිබුණ ද විශේෂයෙන් උදේ ශිෂ්‍යයින් අධ්‍යයන කටයුතු සඳහා සූදානම් වන විට ජල සැපයුම ඉතා අඩු මට්ටමකට පත් වේ. නෑමට මෙන්ම රෙදි සෝදා ගැනීම සඳහා ඔවුනට අසල්වැසි ගෙවත්තක පහළ ඇති ළිඳක් වෙත යාමට සිදුවී තිබේ. ප්‍රමාණවත් වැසිකිළි හෝ කැසිකිළි සංඛ්‍යාවක් හෝ නොමැති වීම ද ශිෂ්‍යයන්ට නියමිත වේලාවට අධ්‍යයන කටයුතු සඳහා සූදානම් වීමට බාධාවක් වී තිබේ. නේවාසිකාගාරවල සිටින ශිෂ්‍යයින්ට අවශ්‍ය කෑම පිසිනු ලබන්නේ අර්ධ ස්ථිර ගොඩනැගිල්ලක ය. එහි ගෑස් උඳුනක් ඇති නමුත් සියලුම ආහාර පිසීම සඳහා එය ප්‍රමාණවත් නොවන හෙයින් ප්‍රධාන ආහාර පිසීම සඳහා දර ළිප් භාවිත කෙරේ.

විද්‍යා පීඨයේ ඇති පරිගණක වැඩි සංඛ්‍යාවක් ක්‍රියාවිරහිතව පවතින අතර බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර, විද්‍යුත් ඡායා පිටපත් උපකරණ හා අන්තර්ජාල පහසුකම් මෙතෙක් ලබා දී නොමැත. පුස්තකාලයේ පැරණි පොත්පත් විශාල සංඛ්‍යාවක් තිබුණ ද එහි පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවේ. එමෙන්ම එහි පුස්තක නාමාවලි සැකසීම හා යාවත්කාලීන කිරීම අතින් කිරීමට සිදුවී තිබේ. ක්‍රීඩා භූමිය සඳහා අක්කර දෙකක පමණ තැනිතලා ඉඩමක් ඇති නමුත් එහි ක්‍රීඩා කිරීමට අවශ්‍ය අනෙකුත් පහසුකම් නොමැත. විද්‍යා පීඨය වටා ඇති කම්බි වැට නිසියාකාරව නඩත්තු නොකිරීමෙන් අවට නිවැසියන්ගේ ගවයන්ගෙන් මෙන්ම ගවයන් ගෙන එන ගව හිමියන්ගෙන් ද පීඨ භූමිය තුළ සිටුවා ඇති එළවළු, පලතුරු හා මල්පැළවලට නිරන්තරයෙන් හානි සිදු වේ. එමෙන්ම යාබද ගමෙහි වෙසෙන නොහික්මුණු තරුණයන් පීඨ පරිශ්‍රය තුළට ඇතුළුවී සිදු කරනු ලබන නොමනා කටයුතු හා සොරමැරකම් පිළිබඳව වාර්තා වූ අවස්ථා ද එමට ය.

විද්‍යා පීඨයේ ඇති මෙබඳු අඩු පහසුකම් සම්බන්ධයෙන් පාලක පක්ෂය මෙන්ම ශිෂ්‍යයෝ ද නිරන්තරයෙන් අදාළ බලධාරීන් වෙත කරුණු ඉදිරිපත් කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලබන වර්ෂයේ විද්‍යා පීඨය ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 10 ක මුදලක් වෙන් කර ඇති බවත් එම මුදලින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරනු ලබන අවශ්‍යතා ඇතුළත් දළ ඇස්තමේන්තුවක් සහිත ව්‍යාපෘති සැලැස්මක් කඩිනමින් ඉදිරිපත් කරන ලෙසත් විද්‍යා පීඨ කොමසාරිස්වරයාගෙන් පීඨාධිපතිවරයා වෙත ලිපියක් ලැබුණි.

[ 7 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

(i) ලබන වර්ෂය සඳහා රාජපුර ජාතික ගුරු අධ්‍යාපන විද්‍යා පීඨයට වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන මගින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරනු ලබන අවශ්‍යතා ඇතුළත් කොට සකස් කරනු ලබන ව්‍යාපෘති සැලැස්මට අඩංගු කළ යුතු යැයි ඔබ විසින් අදහස් කරනු ලබන ව්‍යාපෘති 10 ක් ප්‍රමුඛතා අනුපිළිවෙළින් දක්වන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

*(ලකුණු 10 යි)*

(ii) එම ව්‍යාපෘති සැලැස්මෙහි ඔබ විසින් ප්‍රමුඛස්ථානයෙහි ලා නම් කරන ලද ව්‍යාපෘති දෙක, එසේ නම් කරනු ලැබීම සඳහා තෝරා ගැනීමට හේතුවූ කරුණු කවරේ දැයි වෙන වෙනම කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) .....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

(ආ) .....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

*(ලකුණු 05 × 2 = 10 යි)*

[ 8 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

Department of Examinations, Sri Lanka

(iii) ඔබ විසින් නම් කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් පොදුවේ විද්‍යා පීඨයේ ගුණාත්මක අධ්‍යාපනික සංවර්ධනය සඳහා ලැබෙන දායකත්වය කෙබඳු වන්නේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

*(ලකුණු 10 යි)*

* * *

Department of Examinations, Sri Lanka

[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015 (2016)


## (03) අධ්‍යාපන මූලධර්ම

පැ. එකයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.
**1 2 3 4**

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.

....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

....................................

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **07** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු **මෙම** පත්‍රයේ ම සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය එකකි.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු හෝ පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 9 | |
| 3 | 10 - 17 | |
| 4 | 18 - 24 | |
| 5 | 25 - 32 | |
| 6 | 33 - 43 | |
| 7 | 44 - 50 | |
| එකතුව | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

- අංක 1 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. ප්ලේටෝ ඉදිරිපත් කළ අධ්‍යාපන දර්ශනයේ මූලික පරමාර්ථය කුමක් ද?
   (1) සාධාරණය හා යුක්තිය රජ කරන සදාචාරසම්පන්න සමාජයක් බිහිකිරීම
   (2) සමබර පෞරුෂයෙන් යුත් පුද්ගලයෙක් බිහි කිරීම
   (3) යහපත් ගුණ ගරුක පුරවැසියෙක් බිහිකිරීම
   (4) සම්පත් සාධාරණව හා සමානුපාතිකව බෙදා හැරීම (.........)

2. "එමිල් දන්නේ ටිකයි. එහෙත් ඔහු දන්නා දෙය ඔහුගේම ය. එසේම ඒ දෙය ඔහු හොඳින් දනී" යන ළමා අධ්‍යාපන ක්ෂෙත්‍රයට වැදගත් අදහස ඉදිරිපත් කරන ලද දාර්ශනිකයා කවරෙක් ද?
   (1) ජෝන් ඩූවි (2) ප්ලේටෝ (3) ජීන් ජැක්ස් රූසෝ (4) මහත්මා ගාන්ධි (.........)

3. ජෝන් ඩූවිගේ දර්ශනය අයත් වන්නේ මින් කුමන අධ්‍යාපන චින්තනයකට ද?
   (1) විඥාන වාදය (2) ස්වභාවධර්ම වාදය
   (3) සාංදෘෂ්ටික වාදය (4) උපයෝගිතා වාදය (.........)

4. පාසලක ක්‍රියාවලිය සැලසුම්කිරීමේ දී අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු වඩාත්ම ප්‍රයෝජනවත් වන අවස්ථාව වන්නේ මින් කුමක් ද?
   (1) භෞතික සම්පත් කාර්යක්ෂමව සැලසුම් කිරීම
   (2) දැක්මක් හා මෙහෙවර ප්‍රකාශයක් ගොඩ නැගීම
   (3) අවශ්‍ය මානව සම්පත තීරණය කිරීම
   (4) වාර්ෂික කාලසටහන් සැලසුම් කිරීම (.........)

5. සමාජමිතික පරීක්ෂණ ක්‍රමයෙන් සිදු කෙරෙන කාර්යය කුමක් ද?
   (1) පුද්ගලයෙක් තවත් පුද්ගලයෙක් කෙරෙහි දක්වන කැමැත්තේ ප්‍රමාණය මැනීම
   (2) සමාජ කණ්ඩායමක් තවත් කණ්ඩායමක් අතර ඇති සම්බන්ධතාව මැනීම
   (3) සමාජමිතික ප්‍රස්තාරයක් සඳහා අවශ්‍ය සැලැස්ම සැකසීම
   (4) සමාජ කණාමැදිරි හා සමාජ තරු අතර සබඳතාව මතුකර ගැනීම (.........)

6. පහළ සමාජ කණ්ඩායම්වල උප සංස්කෘතියේ වැදගත් අංග විරහිතවීම, එම සමාජ කණ්ඩායම්වලට අයත් දරුවන්ගේ අධ්‍යාපනයට බාධා පමුණුවන බව සොයාගෙන ඇති න්‍යාය කුමක් ද?
   (1) අන්තර් ආශ්‍රය පිළිබඳ න්‍යාය (2) සංස්කෘතික දරිද්‍රතා න්‍යාය
   (3) ක්ෂේත්‍ර න්‍යාය (4) සංස්කෘතික ප්‍රාග්ධන න්‍යාය (.........)

7. වර්තමාන අධ්‍යාපන ආයතනයක ක්‍රියාත්මකව පවතින සමාජ සමූහ හැඳින්වීමට වඩාත්ම සුදුසු වර්ගීකරණය කුමක් ද?
   (1) සිරස් සමූහ හා තිරස් සමූහ (2) කුඩා සමූහ හා විශාල සමූහ
   (3) අභ්‍යන්තර සමූහ හා බාහිර සමූහ (4) විධිමත් සමූහ හා අවිධිමත් සමූහ (.........)

8. සමාජ වෙනස්වීම් හා අධ්‍යාපනය අතර පැවතිය යුතු සම්බන්ධතාවේ වඩාත්ම යෝග්‍ය ස්වරූපය ප්‍රකාශ වන්නේ පහත කවරකින් ද?
   (1) සමාජ වෙනස්වීම් සැලකිල්ලට ගෙන අධ්‍යාපනය වෙනස් කළ යුතු ය.
   (2) සමාජමය පරිවර්තනයක් සඳහා අධ්‍යාපනය පුරෝගාමී විය යුතු ය.
   (3) සමාජ වෙනස්වීම් නිසා අධ්‍යාපනයේ ද අධ්‍යාපනය නිසා සමාජයේ ද වෙනසක් විය යුතු ය.
   (4) සමාජ වෙනස්වීම් මෙන්ම අධ්‍යාපන වෙනස්වීම් ද රටක් තුළ සිදු විය යුතු ය. (.........)

9. වර්තමාන ගුරු භූමිකාවේ දී ශිෂ්‍ය අවශ්‍යතා, හැකියා හා කැමැත්ත මත ඉගෙනීමට යොමු කිරීම හඳුන්වනු ලබන්නේ මින් කුමන නමකින් ද?
   (1) සම්ප්‍රේෂණ භූමිකාව (2) පරිණාමන භූමිකාව
   (3) ගනුදෙනු භූමිකාව (4) කළමනාකරණ භූමිකාව (.........)



Department of Examinations, Sri Lanka

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE



10. ගුරු භූමිකාව සම්බන්ධ ගැටුම්වලට හේතුවක් නොවිය හැක්කේ මින් කුමක් ද?
   (1) භූමිකා සමූහයට අයත් පිරිසේ අපේක්ෂණ සමාන නොවීම
   (2) භූමිකා චර්යාව පුද්ගලයාට හා අවස්ථාවට අනුව වෙනස් වීම
   (3) භූමිකාවට බලපෑම් කරන පුද්ගලයන් සමග අනුපිළිවෙළින් කටයුතු කිරීම
   (4) භූමිකා රූසක චර්යා ගුරුවරයාට ඇරීමට සිදුවීම (.........)

11. අනෙකුත් වෘත්තීන්ට සාපේක්ෂව ගුරු භූමිකාවේ පවතින ප්‍රබලතම වෙනස්කම මින් කුමක් ද?
   (1) වගකීම් බලතල සම්භාරයක් හිමි වී තිබීම
   (2) සජීවී පිරිසක් සමග වැඩි වශයෙන් කටයුතු කිරීමට සිදුවීම
   (3) අයිතිවාසිකම්වලට වඩා සේවයක් ලෙස කටයුතු කිරීමට සිදුවීම
   (4) වෘත්තීයමය තීරණ සඳහා පූර්ණ ස්වාධීනතාවක් පැවතීම (.........)

12. පහත දැක්වෙන ක්‍රියාමාර්ග අතුරින් ගුරු භූමිකාවට අයත් යැයි පිළිගත නොහැකි ක්‍රියාමාර්ගය කුමක් ද?
   (1) පාසල් සංවර්ධන සංගමයේ ලේකම් තනතුර දැරීම
   (2) විෂයයට අදාළ අතිරේක පොත් කියවීමට වැඩිපුර කාලය යෙදවීම
   (3) ඉරිදා දිනයේ දී දහම් පාසලේ ආගම විෂයය ඉගැන්වීම
   (4) සවස් කාලයේ පාසල් සිසුන්ගේ නිවෙස්වලට ගොස් ඉගැන්වීම (.........)

13. යුනෙස්කෝ අධ්‍යාපන ප්‍රතිපත්තියක් නොවන්නේ මින් කුමක් ද?
   (1) අධ්‍යාපනය පොදුජනතාවගේ කැමැත්ත අනුව සිදුවන සේවාවක් විය යුතු ය.
   (2) අධ්‍යාපනය සඳහා රටට අවශ්‍ය පාසල් පහසුකම් නොමිලේ ලබාදිය යුතු ය.
   (3) රජයේ පාසල් හැර වෙනත් ආයතනවලට දරුවන් යවා අධ්‍යාපනය දීම වැළැක්විය යුතු ය.
   (4) දෙමාපිය නිදහසට බාධා නොවන ලෙස දුෂ්කරතා ඇති දරුවන්ට ආධාර කළ යුතු ය. (.........)

14. සම අධ්‍යාපන අවස්ථා සැලසීමේ ප්‍රතිපත්තිය සාර්ථක කර ගැනීම සඳහා සාධාරණත්වය සැලසිය යුතු යැයි පිළිගෙන ඇති අවස්ථා කවරේ ද?
   (1) අධ්‍යාපනයට පිවිසීම, රැඳීසිටීම, අධ්‍යාපනික සාධනය, අධ්‍යාපන ප්‍රතිලාභ
   (2) අධ්‍යාපනයට පිවිසීම, රැඳීසිටීම, අධ්‍යාපන තේරීම, සමත්වීම
   (3) මව්බසින් ඉගෙනීම, පාසලට පිවිසීම, විෂය ධාරා තේරීම, අධ්‍යාපන ඵල
   (4) පෙරපාසල් අධ්‍යාපනය, ප්‍රාථමික පිවිසීම, ද්විතීයික අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය (.........)

15. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රගතිය ප්‍රදර්ශනය වන දර්ශකයක් නොවන්නේ මින් කුමක් ද?
   (1) සිසුන් පාසලේ රැඳීසිටීමේ වර්ෂවල සාමාන්‍යය ඉහළ අගයක් ගැනීම
   (2) ගුරු ශිෂ්‍ය අනුපාතය 1 : 17 මට්ටමින් පැවතීම
   (3) වැඩිහිටි සාක්ෂරතා ප්‍රතිශතය 98.1% මට්ටමක පැවතීම.
   (4) සමහර පාසල් සඳහා ඇති ඉල්ලුම ඉහළ මට්ටමක පැවතීම. (.........)

16. රටක අධ්‍යාපන සැලසුම්කරණයේ දී යුනෙස්කෝ නිර්දේශවලට එකඟ නොවන ක්‍රියාමාර්ගයක් වන්නේ මින් කුමක් ද?
   (1) රටක සම්පත්වලට හා අවශ්‍යතාවලට ගැළපෙන ලෙස අධ්‍යාපනය සැකසීම
   (2) කෙටිකාලීන සැලසුම් නොව දිගුකාලීන සැලසුම් සකස් කිරීම
   (3) අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක සංවර්ධනය සැලසුම් කිරීම
   (4) තම මව්බසින් ඉගැන්විය හැකි ගුරු පිරිසක් තැනීම (.........)

17. සැලසුම්කරණය හා කළමනාකරණය අතර සබඳතාව නිවැරදිව දැක්වෙන ප්‍රකාශය මින් කුමක් ද?
   (1) සීමිත සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට සැලසුම්කරණයට වඩා කළමනාකරණය වැදගත් වේ.
   (2) සැලසුම්කරණයට පෙර කළමනාකරණය සිදුවිය යුතු ය.
   (3) මෙම ක්‍රියාවලි දෙක එකිනෙකින් පෝෂණය වන ක්‍රියාවලියකි.
   (4) කාර්යක්ෂම බව කළමනාකරණයටත් ඵලදායීතාව සැලසුම්කරණයටත් අවශ්‍ය වේ. (.........)

[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

18. 2005/24 චක්‍රලේඛයට අනුව පාසල් නගා සිටුවීමේ වැඩ සටහන යටතේ පාසල් කළමනාකරණය පිළිබඳ තීරණ ගැනීම සඳහා පිහිටුවීමට නියමිත මණ්ඩල දෙක කවරේ ද?
   (1) පාසල් සංවර්ධන කමිටුව හා පාසල් කළමනාකරණ කණ්ඩායම
   (2) පාසල් කළමනාකරණ කමිටුව හා අධීක්ෂණ කමිටුව
   (3) පාසල් පාදක කළමනාකරණ කමිටුව හා පාසල් සංවර්ධන කමිටුව
   (4) පාසල් කමිටුව හා පාසල් සංවර්ධන සංගමය (.........)

19. අධ්‍යාපන පරීක්ෂණයක යෝග්‍යතාව සලකා බැලීමේ දී වඩාත්ම වැදගත්කොට සැලකිය හැකි කරුණ මින් කුමක් ද?
   (1) ප්‍රශ්නවලට සපයන පිළිතුරු පුද්ගලබද්ධ බවින් තොරව ලකුණු කළ හැකි ද යන්න
   (2) අදාළ විෂය ක්ෂේත්‍රයේ සෑම මාතෘකාවක්ම ආවරණය වන පරිදි පරීක්ෂණය සකස් කර ඇත් ද යන්න
   (3) පිළිතුරු පත්‍රයට පැවරෙන ලකුණු මගින් අදාළ ගති ලක්ෂණයේ සාධන මට්ටම කොතෙක් දුරට නිවැරදිව නිරූපණය වේ ද යන්න
   (4) විවිධ බුද්ධිමය හැකියා මැනෙන අන්දමට ප්‍රශ්න ඇතුළත් කර ඇත් ද යන්න (.........)

20. ශිෂ්‍ය කාර්ය සාධනය පිළිබඳව කරනු ලබන තක්සේරුවක දී "සුතත්‍යතාව (Authenticity)" යන පදයෙන් අදහස් කෙරෙන්නේ පහත සඳහන් කවර ගුණාංගය ද?
   (1) ප්‍රායෝගික බව
   (2) විශ්වස්‍යතාවෙන් යුත් ලකුණක් පැවරීමට ඇති හැකියාව
   (3) ඇගයුම පාසල පදනම් වූවක් බව
   (4) සැබෑ ජීවිතයට අදාළත්වය (.........)

21. ලකුණු පරිවර්තනය සඳහා භාවිත කරන Z ලකුණ සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය නිවැරදි වන්නේ ද?
   (1) ලකුණුවල ව්‍යාප්තිය අවශ්‍යයෙන්ම ප්‍රමත ව්‍යාප්තියකට අනුකූල වේ.
   (2) ප්‍රතිමාන මූලික ඇගයුමකට යොදාගත හැකි ලකුණකි.
   (3) සිසු සාධන මට්ටම තීරණය කිරීමට භාවිත කළ හැකි ලකුණකි.
   (4) $Z = 0$ මගින් නිරූපණය වන්නේ මධ්‍යස්ථ ලකුණයි. (.........)

22. කණ්ඩායම් ක්‍රමයට ක්‍රියාකාරී පාඩමක් ඉගැන්වීම සඳහා පන්තියක සිසුන් කුඩා කණ්ඩායම් පහකට බෙදිය හැකි යෝග්‍යතම ක්‍රමය මින් කුමක් ද?
   (1) ගුරුවරයාගේ අභිමතය පරිදි කණ්ඩායම් වෙන් කිරීම
   (2) එකේ සිට පහ දක්වා ඉලක්කම් කියා සමාන ඉලක්කම් හිමි අය කණ්ඩායම් කිරීම
   (3) සිසුන්ගේ මිත්‍ර සබඳතා හඳුනාගෙන ඒ අනුව කණ්ඩායම් බෙදීම
   (4) පන්තියේ භෞතික සම්පත්වලට ප්‍රමාණවත් ලෙස කණ්ඩායම් බෙදීම (.........)

23. පවතින දත්තවලින් ඔබ්බට ගොස් නව ප්‍රතිවේදයක් ගොඩනගා ගැනීමට දායක වන ඉගෙනුම් ක්‍රමය මින් කුමක් ද?
   (1) අනාවරණ ක්‍රමය
   (2) පියවර පාඩම් ක්‍රමය
   (3) ගැටලු විසඳීමේ ක්‍රමය
   (4) භූමිකා නිරූපණ ක්‍රමය (.........)

24. ඉගෙනුම් ඉගැන්වීම් ශෛලි පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය මින් කුමක් ද?
   (1) සමාන සුදුසුකම් ඇති ගුරුවරුන්ට විවිධාකාර ඉගැන්වීම් ශෛලි ඇත.
   (2) ගුරුවරයාගේ ඉගැන්වීම් ශෛලිය ශිෂ්‍ය ඉගෙනුම් ශෛලියට ගැළපිය යුතු ය.
   (3) එකම පන්තියේ විවිධාකාර ඉගෙනුම් ශෛලි ඇති සිසුහු සිටිති.
   (4) ඉගැන්වීමේ දී විවිධ ඉගෙනුම් ශෛලි බාධාවක් නොවේ. (.........)

[ 5 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE



25. "එක් දැක්මක් පැවසුම් දහසක් අගනේය" යන පැරණි චීන පිරුළෙහි අධ්‍යාපන තාක්‍ෂණය පිළිබඳව ගැබ්වී ඇති සත්‍යය නිරූපණය වන ප්‍රකාශය මින් කුමක් ද?
    (1) දර්ශනේන්ද්‍රියවලින් වටිනා කාර්යයක් වන නිසා ඒවා රැක ගත යුතු ය.
    (2) දර්ශනයෙන් සංයුක්ත අත්දැකීම් අඩු වෙහෙසකින් ලබා ගත හැකි ය.
    (3) වාචික පැවසුම් මගින් බොහෝ දේ ඉගැන්විය හැකි ය.
    (4) වියුක්ත අත්දැකීම් ලැබීමට දර්ශනයෙන් අගනා මෙහෙයක් ඉටු වේ. (.........)

26. ඉගැන්වීමේ දී සංකල්ප පිළිබඳ නිවැරදි හා නිරවුල් අවබෝධයක් ලැබීමට ආකෘති වඩාත් ඉවහල් වන්නේ ඒවායේ ඇති මින් කුමන සුවිශේෂී ලක්‍ෂණය නිසා ද?
    (1) විශාල දෙයක් කුඩා කර පෙන්වීම
    (2) කුඩා දේ විශාල කර පෙන්වීම
    (3) ත්‍රිමාන ලක්‍ෂණවලින් යුක්ත වීම
    (4) පරිමාණානුකූලව සකසා තිබීම (.........)

27. ශ්‍රී ලංකාවේ පැරණි අගනගර පිහිටි ස්ථාන ඉගැන්වීම පහසු කිරීමට "රූප පිටුතල සංජානනය" නැමැති මනෝවිද්‍යා මූලධර්මයට අනුව සකසන ලද හොඳම සිතියම මින් කුමක් ද?
    (1) ශ්‍රී ලංකාවේ අගනගර පිහිටි ස්ථාන සහිතව අඳින ලද කටු සිතියම
    (2) පුස්තකාලයෙන් ලබාගත් මුද්‍රිත ලොකු ලංකා සිතියම
    (3) නගර, ඓතිහාසික ස්ථාන, භෞතික පිහිටීම, සම්පත් ඇතුළත් පරිමාණානුකූලව සැකසූ ලංකා සිතියම
    (4) පැරණි අගනගර පමණක් ලකුණු කර නම්කළ නිවැරදි ලංකා සිතියම (.........)

28. පන්ති කාමරයක ළමුන් කිහිපදෙනෙකුගේ සාක්‍ෂරතා ගැටලු විසඳීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කරන පර්යේෂණයක් සඳහා හොඳම පර්යේෂණ ප්‍රවේශය මින් කුමක් ද?
    (1) විස්තරාත්මක පර්යේෂණ
    (2) අත්හදා බැලීමේ පර්යේෂණ
    (3) කාර්යමූල පර්යේෂණ
    (4) ඇගයීම් පර්යේෂණ (.........)

29. පර්යේෂණකරණයේ දී "නියාමක පර්යේෂණයක්" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
    (1) පර්යේෂණයකට අවශ්‍ය විමර්ශන සිදු කරන පුස්තකාල පර්යේෂණයකි.
    (2) පර්යේෂණ උපකරණ වලංගු කර ගැනීමට යොදා ගන්නා පරීක්‍ෂණයකි.
    (3) පර්යේෂණ සහායකයින් ඉලක්කවලට යොමු කරන පරීක්‍ෂණයකි.
    (4) සාධන පරීක්‍ෂණයකින් ඉගෙනීමට මග පෙන්වන පර්යේෂණයකි. (.........)

30. පර්යේෂණයක දී වඩාත්ම නිවැරදි හා යථාර්ථවාදී දත්ත සමූහයක් රැස්කිරීම සඳහා පවතින නිරීක්‍ෂණ ක්‍රමවේදය කුමක් ද?
    (1) සහභාගිත්ව නිරීක්‍ෂණය
    (2) සෘජු නිරීක්‍ෂණය
    (3) විධිමත් නිරීක්‍ෂණය
    (4) වක්‍ර නිරීක්‍ෂණය (.........)

- අංක **31** සිට **50** තෙක් ප්‍රශ්නවලට නිවැරදි **පිළිතුර**, දී ඇති **තිත් ඉරි** මත ලියන්න.

31. බෙන්ජමින් එස්. බ්ලූම් විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපනික අරමුණු වර්ගීකරණයේ ප්‍රධාන ක්‍ෂෙත්‍ර තුන නම් කරන්න.
    (i) ..........................................................................
    (ii) ..........................................................................
    (iii) ..........................................................................

32. අධ්‍යාපන කේන්ද්‍රීය සමාජයක් බිහිකිරීම සඳහා විධිමත් අධ්‍යාපන අංශය සමග ප්‍රතිසංස්කරණය විය යුතු අනෙකුත් අධ්‍යාපන අංශ දෙක නම් කරන්න.
    (i) ..........................................................................
    (ii) ..........................................................................

[ 6 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

33. සංස්කෘතිය පවරාදීම සඳහා පාසල් විෂයමාලාවේ පවතින ප්‍රධාන මාර්ග දෙකක් සඳහන් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

34. සමාජ පන්තික බලපෑමෙන් තොරව අධ්‍යාපනයේ සම අවස්ථා ආරක්ෂා කිරීම සඳහා පැවතිය යුතුයැයි හඳුනාගෙන ඇති අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

35. සංස්කෘති දෙකක් හෝ කිහිපයක් එක්ව කටයුතු කරන සමාජයකට ගැළපෙන අධ්‍යාපනය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

..............................................................................................................

36. ගුරු භූමිකාවට අදාළ පුළුල් කාර්යභාරය අර්ථ සම්පන්න ලෙස බෙදා දක්වා ඇති ප්‍රධාන ක්ෂේත්‍ර දෙක නම් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

37. භූමිකා න්‍යාය අනුව ගුරු භූමිකාවට අදාළව හඳුනාගෙන ඇති ප්‍රධාන ගැටුම් වර්ග දෙකක් සඳහන් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

38. ශ්‍රී ලංකාවේ ළමයින් අනිවාර්යයෙන් පාසල්වලට පැමිණීමේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීම සඳහා පිහිටුවිය යුතුයැයි 2016 වර්ෂයේ නියෝග කරන ලද කමිටු දෙක නම් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

39. 2016/1 චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකාවේ පාසල්වල විෂයන්ට අදාළව සිටිය යුතු ගුරුවරු සංඛ්‍යාව තීරණය කිරීමේ දී දෙවන ජාතික භාෂාව අර්ථ දක්වා ඇත්තේ කෙසේ ද?

..............................................................................................................

40. අධ්‍යාපනය ආයෝජනයක් ලෙස සලකනු ලබන අධ්‍යාපන සැලසුම්කරණ ප්‍රවේශ දෙක නම් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

41. 1996 වර්ෂයේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පාසල් නගාසිටුවීමට හඳුන්වා දී ඇති විමධ්‍යගත උපක්‍රමයට අදාළ සංකල්පය හා මණ්ඩලය අනුපිළිවෙළින් නම් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

42. විෂයයක හෝ පාඩමක හෝ ඇගයීම් පත්‍රයක් සැකසීම සඳහා මූලික පදනමක් වශයෙන් සැලකිල්ලට ගත යුතු ප්‍රධාන සාධකය කුමක් ද?

..............................................................................................................

43. ප්‍රජානන නොවන ලක්ෂණ සම්බන්ධ ඇගයීම් විධි දෙකක් නම් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................



Department of Examinations, Sri Lanka

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

44. ප්‍රශ්න පත්‍රයක කිසියම් ප්‍රශ්නයක් අපේක්ෂකයින්ට කොතරම් පහසු හෝ අපහසු වූවා ද යන්න ගණනය කරනු ලබන දර්ශකය හඳුන්වන නම කුමක් ද?

..............................................................................................................

45. ගුරු පුහුණුවක දී ගුරුවරයකු සතු විය යුතු එක් කුසලතාවක් කුඩා කණ්ඩායමක් යොදවා කෙටි කාලයක් තුළ සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ආරම්භ වූ ඉගැන්වීමේ ක්‍රමය නම් කරන්න.

..............................................................................................................

46. බී. එෆ්. ස්කිනර්ගේ ප්‍රබෝධක ප්‍රතිචාර න්‍යාය පදනම් කරගෙන නිර්මාණය වී ඇති ස්වයං ඉගෙනීමේ ක්‍රමය නම් කරන්න.

..............................................................................................................

47. පාඩමකට ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක් තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු අත්‍යවශ්‍ය මූලධර්මය කුමක් ද?

..............................................................................................................

48. ඕනෑම කඩදාසියක ඇති ලිඛිත දේ මෙන්ම රූප වර්ණවත්ව විශාලකර පෙන්විය හැකි නවතම තාක්ෂණික උපකරණය හඳුන්වන නම කුමක් ද?

..............................................................................................................

49. පර්යේෂණයක දී රැස්කර ගන්නා දත්තවල ස්වභාවය අනුව පර්යේෂණ හැඳින්විය හැකි වර්ග දෙක නම් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

50. අධ්‍යාපන පර්යේෂණ ගැටලුවක් සම්බන්ධ සියලු පිරිස හා පර්යේෂණයට ලක්කර ගන්නා පිරිස හඳුන්වන නම් අනුපිළිවෙළින් දක්වන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

* * *

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka